ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| 13 ශ්‍රේණිය | 21 | S | I | ආර්ථික විද්‍යාව I<br>Economics I | කාලය : පැය දෙකයි<br>Time : Two hours |
|---|---|---|---|---|---|

**උපදෙස් :**


- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **01** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර** තෝරාගෙන, එය පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

01. පහත සඳහන් ප්‍රකාශ අතරින් යථානුරූපී සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක ප්‍රකාශයක් ලෙස සැලකිය හැක්කේ කවරක් ද?
    (1) $C = a + by$ පරිභෝජන ශ්‍රිතයට අනුව ආදායම සහ පරිභෝජනය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී.
    (2) මෝටර් රථ ආනයන බදු ඉහළ දැමීම ආනයන පිරිවැය අඩු වීමට හේතු වේ.
    (3) රාජ්‍ය අයවැය හිඟය මූල්‍යායනය ප්‍රසාරණාත්මක වේද යන්න හිඟය මූල්‍යායනය කරන ආකාරය මත තීරණය වේ.
    (4) සමාහාර සැපයුම් වක්‍රය දකුණට විතැන් කිරීමෙන් මිල පීඩනය අවම කර ගත හැකිය.
    (5) විරැකියාව අවම කිරීමට නම් ස්ත්‍රී සේවා නියුක්තිය ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතුය.

02. වෙරළ තීරයේ වැලි තැන්පත් කිරීම මගින් වර්ධනය වන්නේ පහත සඳහන් නිෂ්පාදන සාධක අතරින් කවරක්ද?
    (1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය
    (4) ව්‍යවසායකත්වය (5) මානව ප්‍රාග්ධනය

03. නූතන තාක්ෂණය සමඟ බද්ධ වෙමින් ආගම හෝ සම්ප්‍රදායික සමාජයක් හෝ පදනම් කර ගනිමින් තීරණ ගන්නා ආර්ථිකයක් හඳුන්වනු ලබන්නේ,
    (1) සමාජයීය වෙළඳපොළ ආර්ථිකයක් ලෙසය.
    (2) සාම්ප්‍රදායික ආර්ථික පද්ධතියක් ලෙසය.
    (3) ධනවාදී ආර්ථික පද්ධතියක නව ප්‍රවණතාවක් ලෙසය.
    (4) නව සාම්ප්‍රදායික ආර්ථික පද්ධතියක් ලෙසය.
    (5) විධානගත ආර්ථික පද්ධතියක නව ප්‍රවණතාවක් ලෙසය.

04. රූප සටහනෙහි දැක්වෙන නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත A සිට B දක්වා ගමන් කරන විට,
    (1) සහල් නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය අඩුවේ.
    (2) රෙදි නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය අඩු වේ.
    (3) සහල් සඳහා යොදවන සම්පත්වල කාර්යක්ෂමතාවය ඉහළ යයි.
    (4) සහල් සඳහා යොදවන සම්පත් ඒකකයකින් නිපදවිය හැකි සහල් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වේ.
    (5) සහල් සැපයුම වැඩි වී වෙළඳපොළ සහල් මිල පහළ වැටේ.



05. රටක් පවත්නා ලෝක මිල යටතේ භාණ්ඩයක් ආනයනය කරන විට අදාළ රටේ ආනයන සැපයුම් වක්‍රය,

(1) පූර්ණ නම්‍ය වේ. (2) පූර්ණ අනම්‍ය වේ. (3) ඒකීය නම්‍ය වේ.
(4) නම්‍ය වක්‍රයක් වේ. (5) අනම්‍ය වක්‍රයක් වේ.


06. කිසියම් භාණ්ඩයක මිල පහළ ගිය විට ආදේශණ ප්‍රතිවිපාකයට හා ආදායම් ප්‍රතිවිපාකයට අනුව එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය වැඩි වූයේ නම් එම භාණ්ඩයේ ස්වරූපය හඳුන්වන්නේ කෙසේ ද?

(1) ගිෆන් භාණ්ඩයකි. (2) ආදේශණ භාණ්ඩයකි. (3) සාමාන්‍ය භාණ්ඩයකි.
(4) බාල භාණ්ඩයකි. (5) සුඛෝපභෝගී භාණ්ඩයකි.

07. සලකා බලන භාණ්ඩය බාල භාණ්ඩයක් නම් ආදායමෙහි හට ගන්නා ඉහළ යාමක් නිසා එම භාණ්ඩයේ,

(1) ඉල්ලුම වැඩිවේ. මිල ඉහළ යයි. ප්‍රමාණය වැඩි වේ.
(2) ඉල්ලුම අඩුවේ. මිල වැඩිවේ. ප්‍රමාණය අඩුවේ.
(3) ඉල්ලුම අඩුවේ. මිල අඩුවේ. ප්‍රමාණය අඩුවේ.
(4) සැපයුම වැඩිවේ. මිල අඩුවේ. ප්‍රමාණය වැඩි වේ.
(5) ඉල්ලුම වැඩි වේ. මිල අඩුවේ. ප්‍රමාණය අඩු වේ.

08. $x$ නැමති භාණ්ඩය සඳහා වෙළඳපොළ සැපයුම් වක්‍රය පහත රූප සටහනේ පෙන්නුම් කරයි.





මෙම වෙළඳපොළේ සමතුලිත ප්‍රමාණය A ලක්ෂ්‍යයේ සිට B ලක්ෂ්‍ය දක්වා ගමන් කිරීමට හේතු විය හැකි සාධකයක් වන්නේ,

(1) පාරිභෝගික ආදායම පහළ යාම.
(2) පාරිභෝගික ආදායම ඉහළ යාම.
(3) අනුපූරක භාණ්ඩ මිල පහළ යාම.
(4) $x$ භාණ්ඩය සඳහා පාරිභෝගික රුචිය වැඩිවීම.
(5) $x$ භාණ්ඩයේ සැපයුම අඩුවීම.

09. පහත දැක්වෙන රූප සටහනට අනුව A ලක්ෂ්‍යයේ දී මිල ඉල්ලුම් නම්‍යතාවය කොපමණ ද?

(1) – 0.25
(2) – 2
(3) – 1
(4) – 4
(5) – 0.5





10. එක්තරා භාණ්ඩයක වෙළඳපොළ ඉල්ලුම් ශ්‍රිතය Qd = 20 – 2P ද අධි ඉල්ලුම් ශ්‍රිතය Ed = 30 – 6P නම් වෙළඳපොළ සමතුලිත වන විට නිෂ්පාදන අතිරික්තය වන්නේ,

(1) රු. 25.00 (2) රු. 12.50 (3) රු. 50.00
(4) රු. 37.50 (5) රු. 32.50

11. කිසියම් භාණ්ඩයක වෙළඳපොළ සමතුලිතයට පත් වී ඇති ආකාරය පහත රූප සටහනින් දැක්වේ. මෙම භාණ්ඩයේ යෙදවුම් මිල ගණන් පහළ වැටීමක් සිදු වුවහොත්,


| | මිල වෙනස්වීම | පාරිභෝගික අතිරික්තය |
|---|---|---|
| (1) | අඩුවේ. | අඩුවේ. |
| (2) | අඩුවේ. | වෙනස් නොවේ. |
| (3) | වැඩිවේ. | වැඩිවේ. |
| (4) | වැඩිවේ. | අඩුවේ. |
| (5) | අඩුවේ. | වැඩිවේ. |




12. රජය වෙළඳපොළට මැදිහත් වී භාණ්ඩයක් මත රු.5 ක ඒකක බද්දක් පැන වූ නිසා එම භාණ්ඩයේ මිල රු.4 කින් වැඩි විය. මෙම භාණ්ඩයේ සැපයුම් නම්‍යතාවය 1.2 ක් නම් ඉල්ලුම් නම්‍යතාව වන්නේ,

(1) – 1.5 (2) – 0.3 (3) – 0.9 (4) – 0.4 (5) – 2.0

13.





ඉහත රූප සටහනට අනුව රු.5 ක විශේෂිත සහනාධාරයක් ලබා දීමෙන් පසු දකුණට විතැන් වූ සැපයුම් වක්‍රය $S_1$ මඟින් දැක්වේ. සහනාධාරය ලබා දීම නිසා නිෂ්පාදන අතිරික්තයේ සිදු වූ වෙනස.

(1) රු.370 කින් වැඩිවේ. (2) රු.560 ක් ලෙස ස්ථාවරව පවතී. (3) රු.437.50 කින් වැඩිවේ.
(4) රු.400 කින් වැඩිවේ. (5) රු.150 දක්වා අඩුවේ.

14. පූර්ණ අනම්‍ය සැපයුමක් ඇති භාණ්ඩයකට රජය රු.60 ක සහතික මිලක් සහිත මිල ආධාරක ප්‍රතිපත්තියක් පැනවීමෙන් පසු වෙළඳපොළේ හැසිරීම පහත රූප සටහන මඟින් දැක්වේ. අතිරික්ත සැපයුම රජය මිල දී ගන්නේ නම් රජයට දැරීමට සිදුවන පිරිවැය වන්නේ,

(1) රු.4000
(2) රු.6000
(3) රු.3000
(4) රු.1000
(5) රු.2000




15. එක්තරා ව්‍යාපාරික ආයතනයක පිරිවැය දත්ත පහත දැක්වේ.

මුළු විචල්‍ය පිරිවැය රු. 7200
සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු.20
සාමාන්‍ය මුළු පිරිවැය රු.100

ආයතනයේ වර්තමාන නිමැවුම් මට්ටම විය යුත්තේ,

(1) ඒකක 60 කි.
(2) ඒකක 72 කි.
(3) ඒකක 90 කි.
(4) ඒකක 100 කි.
(5) ආදායම පිළිබඳ දත්ත නොමැති නිසා නිගමනය කළ නොහැක.

16. පූර්ණ තරඟකාරි ආයතනයක ලක්ෂණයක් ලෙස සැලකිය නොහැක්කේ,
   (1) පැවරුණු මිලක් යටතේ ක්‍රියාකරන්නෙකු වීම.
   (2) ආයතනය මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය ප්‍රමාණ අක්ෂයට සමාන්තර වීම.
   (3) දිගු කාලයේ දී ප්‍රාමාණික ලාභ පමණක් භුක්ති විඳීම.
   (4) කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය ප්‍රමාණ අක්ෂයට සමාන්තර තිරස් රේඛාවක් වීම.
   (5) ආයතනයේ සැපයුම් වක්‍රය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය අවම ලක්ෂ්‍යයට ඉහළින් ඇති ආන්තික පිරිවැය වක්‍රයයි.

17. නිමැවුම ඒකක 4 දී මුළු පිරිවැය රු.20 ක් වන අතර නිමැවුම් ඒකක 6 දී මුළු පිරිවැය 36 කි. නිමැවුම ඒකක 4 හා 6 අතර ආන්තික පිරිවැය,
   (1) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා අඩුවේ.
   (2) සාමාන්‍ය පිරිවැයට සමාන වේ.
   (3) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩිවේ.
   (4) සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩිවේ.
   (5) අතිරේක තොරතුරු නොමැතිව කිසිදු සාමාන්‍ය පිරිවැයක් සමඟ සැසඳිය නොහැක.


18. සාධක වෙළඳපොළෙහි යම් සාධකයක් සඳහා වෙළඳපොළ සමතුලිතයේ දී පවතින සංක්‍රාම ඉපැයීමේ වටිනාකම, ආර්ථික බදු කුලියට වඩා විශාල විය. මෙම සාධකයට තිබෙන සැපයුම් නම්‍යතාවය,
   (1) නම්‍ය වේ. (2) පූර්ණ නම්‍ය වේ. (3) අනම්‍ය වේ.
   (4) ඒකීය නම්‍ය වේ. (5) පූර්ණ අනම්‍ය වේ.

19. සාර්ව ආර්ථිකයේ සෘණ නිමැවුම් පරතරයක් නිරූපණය කරනුයේ ව්‍යාපාර චක්‍රයෙහි කවර අදියරයක දී ද?
   (1) පතුල (2) පසුබැසීම (3) ප්‍රසාරණය
   (4) මුදුනත (5) උත්පාතය

20. ශ්‍රී ලංකාවේ නිරීක්ෂණය නොවන ආර්ථිකය තුළට ඇතුළත් නොවන ආර්ථික කටයුත්ත කුමක් ද?
   (1) ආර්ථික සංගණන සහ සමීක්ෂණවලදී මඟ හැරී යන නිෂ්පාදන කටයුතු.
   (2) ගිණුම් පවත්වා නොගනිමින් නිවාස ආශ්‍රිතව අසංවිධිතව සිදු කරන භාණ්ඩ නිෂ්පාදන කටයුතු.
   (3) රහසිගතව නීති විරෝධීව සිදු කරනු ලබන වැලිගොඩ දැමීම.
   (4) බදු ගෙවීමට සිදු වෙතැයි බියෙන් සහ කම්කරු නීති මඟහැර යාමට සඟවන නිෂ්පාදන කටයුතු.
   (5) බලපත්‍ර සහිතව මත්පැන් නිපදවීම සහ අලෙවි කිරීම.

21. රටක මූලික මිලට සමස්ත එකතු කළ අගය රුපියල් මිලියන 960 කි. එම රටේ අවසන් පරිභෝජන වියදම රුපියල් මිලියන 600 ක් වන අතර භාණ්ඩ හා සේවා මත ශුද්ධ බදු වටිනාකම රු.මි.40 කි. ශුද්ධ ප්‍රාථමික ආදායම් ලැබීම් - 300 සහ ශුද්ධ වර්තන සංක්‍රාම (ද්විතියික ආදායම) වටිනාකම 150 කි. මෙම රටේ ජාතික ඉතුරුම් අනුපාතය කීයද?
   (1) 20% (2) 25% (3) 30% (4) 40% (5) 5%

22. සරල ආර්ථිකයකට අදාළ රූප සටහන් පහත දැක්වේ.




ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති මට්ටමේ පසුවේ යැයි උපකල්පනය කොට මෙම ආර්ථිකයේ පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම (Yf) වනුයේ,
   (1) රු.මි.2000 (4) රු.මි.2500
   (2) රු.මි.1250 (5) රු.මි.1300
   (3) රු.මි.1750

23. සරල ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය C = 200 + 0.75 yd යැයි ද රජය ආර්ථික ක්‍රියාකාරිත්වයට මැදිහත් වී රු.මි.80 ක ස්ථාවර බද්දක් අය කළේ නම් ආරම්භක වශයෙන් පරිභෝජන ඉල්ලුම පහත වැටිය හැකි මුළු ප්‍රමාණය හා ජාතික ආදායම සංකෝචනය වන ප්‍රමාණය කොපමණ ද?

| | පරිභෝජන ඉල්ලුම අඩුවීම (රු.මි.) | ජාතික ආදායම අඩුවීම |
|---|---|---|
| (1) | 80 | 150 |
| (2) | 120 | 250 |
| (3) | 60 | 150 |
| (4) | 60 | 240 |
| (5) | 20 | 150 |

24. පහත දැක්වෙන්නේ එක්තරා ආර්ථිකයක වැය කළ හැකි ආදායම සහ පරිභෝජනය පිළිබඳ තොරතුරු කිහිපයකි.

| වැය කළ හැකි ආදායම (රු.මි.) | පරිභෝජනය (රු.මි.) |
|---|---|
| 2000 | 1500 |
| 2100 | 1560 |

මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම රු.මි.1000 ක් නම් ආයෝජනය රු.මි.20 කින් වැඩි කළහොත් නව සමතුලිත ජාතික ආදායම කීයද?

(1) රු.මි.1020
(2) රු.මි.1050
(3) රු.මි.1500
(4) රු.මි.1200
(5) රු.මි.2000

25. කිසියම් ආර්ථිකයක ඉතුරුම් ශ්‍රිතය S = − 800 + 0.2 yd ලෙස සලකන්න. මෙම ආර්ථිකයේ වැය කළ හැකි දළ ජාතික ආදායම රු.මි.100 කින් ඉහළ යයි නම් පරිභෝජන වියදමේ සිදුවන වැඩිවීම කොපමණ ද?

(1) රු.මි.880 කි.
(2) රු.මි. − 780 කි.
(3) රු.මි.80 කි.
(4) රු.මි.100 කි.
(5) රු.මි.20 කි.

26. කිසියම් රටක පොදු මිල මට්ටම නිරූපණය කරන මිල දර්ශකය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතීම ආර්ථික වෘද්ධිය කෙරෙහි බලපාන්නේ යැයි සැලකෙන්නේ,

(1) මිල සානුබලයන් ආයෝජන ප්‍රසාරණයට මහ පෙන්වීම නිසා වෘද්ධිය වේගවත් වන බැවිනි.
(2) උද්ධමනයේ බලපෑමෙන් මූල්‍ය නොවන වත්කම්වල ආයෝජනය ඉහළ යන බැවිනි.
(3) අනාගත ආයෝජන ප්‍රතිලාභ පිළිබඳ අවිනිශ්චිතතාව වෘද්ධියට අහිතකර බැවිනි.
(4) විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය වීම නිසා වෘද්ධිය වේගවත් වන බැවිනි.
(5) දිගු කාලීන ණය අරමුදල් ඉල්ලුම ඉහළ යාම තුළින් නිමැවුම ප්‍රසාරණය වන බැවිනි.

27. පොලී අනුපාතිකයේ ඉහළයාමත් නිසා,

| | **සම්ප්‍රේක්ෂණ මුදල් ඉල්ලුම** | **පුළුල් මුදල් සැපයුම** | **ව්‍යවහාර මුදල්** |
|---|---|---|---|
| (1) | අඩුවේ | අඩුවේ | අඩුවේ |
| (2) | අඩුවේ | වැඩිවේ | අඩුවේ |
| (3) | වැඩිවේ | වැඩිවේ | අඩුවේ |
| (4) | අඩුවේ | අඩුවේ | වැඩිවේ |
| (5) | අඩුවේ | අඩුවේ | වැඩිවේ |

28. කල්පිත වාණිජ බැංකු පද්ධතියක ශේෂ පත්‍රයේ මහ බැංකු සංචිත රු.මි.200 ක් සහ දී ඇති මුළු ණය ප්‍රමාණය රු.මි.1800 කි. තව ද අධි සංචිත ශුන්‍ය වේ යැයි ද මහජනයාගේ තැන්පතු හැරුණු විට වෙනත් වගකීම් හෝ වත්කම් නොමැති බවත් සිතන්න. මහ බැංකුව ව්වලා සංචිත අනුපාතය තවත් සියයට 2.5 කින් ඉහළ දැමුවේ නම් බැංකු පද්ධතියේ පැවතිය හැකි මුළු තැන්පතු ප්‍රමාණය කොපමණ ද?

(1) රු.මි.2500 (2) රු.මි.1500 (3) රු.මි.1600
(4) රු.මි.2400 (5) රු.මි.2000

29. පූර්ණ සේවා නියුක්ති මට්ටමේ පවතින ආර්ථිකයක් උපකල්පනය කරන්න. ආර්ථිකය තුළ පවත්නා උද්ධමන පීඩනය ඉහළ නංවමින් සමාහාර ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමකට හේතු වේ යැයි සැලකිය හැක්කේ කවර තත්ත්වයක් යටතේ ද?

(1) රජයේ සුරැකුම්පත් මහජනතාවට අලෙවි කිරීම.
(2) භාණ්ඩ හා සේවා මත බදු ඉහළ දැමීම.
(3) ගෙවුම් ශේෂයේ හිඟයක් පැවතීම.
(4) පිළිණපත්වල වට්ටම් අනුපාතික පහළ යාම.
(5) මූර්ත පොලී අනුපාතිකය පහළ යාම.

30. වාණිජ බැංකු ශේෂ පත්‍රයේ දැක්වෙන වත්කම් ලැයිස්තුවක් පහතින් දැක්වේ.

| | |
|---|---|
| මහ බැංකු තැන්පතු | විදේශ මුදල් ශේෂ |
| ඒක්ෂණ ණය | ණය හා අත්තිකාරම් |
| වට්ටම් කළ බිල්පත් | ආයෝජන |

මෙම වත්කම් අතරින් වැඩිම ද්‍රවශීලතාවයක් හා වැඩිම ලාභදායිත්වයක් සහිත වත්කම් දෙක කුමක් ද?

(1) මහ බැංකු තැන්පතු සහ ඒක්ෂණ ණය
(2) මහ බැංකු තැන්පතු සහ ණය අත්තිකාරම්
(3) ඒක්ෂණ ණය සහ ණය අත්තිකාරම්
(4) විදේශ මුදල් ශේෂ සහ ආයෝජන
(5) මහ බැංකු තැන්පතු සහ ආයෝජන

31. පහත ප්‍රකාශ අතරින් ඔබට එකඟ විය නොහැකි ප්‍රකාශය කුමක් ද?

(1) පොදු දේපළ සම්පත් වෙළඳපොළ මඟින් කාර්යක්ෂම ලෙස උපයෝජනය වේ.
(2) මිලක් නොගෙවන්නත් පරිභෝජනයෙන් බැහැර කළ හැකි භාණ්ඩ වෙළඳපොළ මඟින් සම්පාදනය වේ.
(3) ශුභ සාධනය පිටාර ගැලීම ශුභ සාධක භාණ්ඩ පරිභෝජනයේ දී සිදුවේ.
(4) රජය අවගුණ භාණ්ඩ පරිභෝජනය අධෛර්යමත් කරයි.
(5) තරඟකාරි නොවන පරිභෝජනයක් පවතින්නේ පොදු භාණ්ඩ සඳහා පමණි.

32. ශීඝ්‍ර ආර්ථික පසුබැසීමකට මුහුණ පා සිටින ආර්ථිකයක නිෂ්පාදන පෙළඹවීමට වඩාත් සඵල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය වන්නේ,

(1) ආදායම් බදු ඉහළ දැමීම.
(2) ආණ්ඩුවේ වියදම් වැඩි කිරීම.
(3) ආණ්ඩුවේ වියදම් අඩු කිරීම.
(4) මහ බැංකුව විසින් විවෘත වෙළඳපොළේ සුරැකුම්පත් අලෙවි කිරීම.
(5) ප්‍රති විකුණුම් අනුපාතය ඉහළ දැමීම.

33. ආදායම වැඩි වන විට ආදායමින් ක්‍රමයෙන් අඩුවන ප්‍රතිශතයක් බදු අය කිරීම හඳුන්වන්නේ,

(1) අනුක්‍රමික ආදායම් බදු අනුපාතික ව්‍යුහයක්
(2) සමානුපාතික ආදායම් බදු අනුපාතික ව්‍යුහයක්
(3) ප්‍රතික්‍රම ආදායම් බදු අනුපාතික ව්‍යුහයක්
(4) ඍජු බදු අනුපාතික ව්‍යුහයක්
(5) වක්‍ර බදු අනුපාතික ව්‍යුහයක්

34. කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ 60 ක් ද ආන්තික සමාජ ප්‍රතිලාභ 110 ක් ද ආන්තික, සමාජ පිරිවැය 80 ක් ද නම් පහත සඳහන් කවරක් නිවැරදි වේද?

(1) ආන්තික සමාජ ප්රතිලාභ ආන්තික සමාජ පිරිවැයට වඩා අඩුවේ.

(2) ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ ආන්තික පෞද්ගලික පිරිවැයට වඩා අඩුවේ.

(3) ආන්තික බාහිර ප්‍රතිලාභ ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ වලට වඩා වැඩිවේ.

(4) ආන්තික බාහිර පිරිවැය ආන්තික පෞද්ගලික පිරිවැයට සමාන වේ.

(5) ආන්තික බාහිර ප්‍රතිලාභ ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ වලට වඩා අඩුවේ.

35. කිසියම් වර්ෂයක දී රාජ්‍ය අයවැයේ වර්තන ගිණුමේ හිඟයක් වාර්තා වුව ද සමස්ත ශේෂය ධන(+) අගයක් ගැනීමට ඉඩ ඇත. ඊට හේතු වේ යැයි සැලකිය හැකි සාධකය වන්නේ කුමක් ද?

(1) පොලී ගෙවීම්


(2) විදේශ ප්‍රදාන

(3) වර්තන සංක්‍රාම

(4) මූල්‍ය වගකීම් අත්පත් කර ගැනීම.

(5) මූර්ත වගකීම් අත්පත් කර ගැනීම.

36. පහත දැක්වෙන්නේ දෙන ලද සම්පත් තොගයකින් A සහ B රටවලට නිපදවිය හැකි උපරිම මෝටර් රථ සහ තිරිඟු ප්‍රමාණයන් ය.




එම තොරතුරු වලට අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) තිරිඟු නිපදවීමේ නිරපේක්ෂ වාසිය ඇත්තේ B රටටය.

(2) මෝටර් රථ නිපදවීමේ නිරපේක්ෂ වාසි ඇත්තේ A රටටය.

(3) තිරිඟු නිපදවීම සඳහා අඩු ආවස්ථික පිරිවැයක් ඇත්තේ B රටටය.

(4) B රට මෝටර් රථ අපනයනය කර තිරිඟු ආනයන කරමින් විදේශ වෙළඳාමට අවතීර්ණ විය යුතුය.

(5) මෝටර් රථ නිපදවීමේ සාපේක්ෂ වාසි ඇත්තේ A රටටය.

37. මෙරට නිපදවන හා ආනයනය කරන සපත්තු වර්ගයක් පිළිබඳව පහත විස්තර සපයා ඇත.

අලෙවි මිල රු.2000
ආනයන යෙදවුම් රු.800
ආනයනික සපත්තු මත බදු අනුපාතිකය 10%
ආනයන යෙදවුම් මත බදු අනුපාතිකය 10%

දේශීය සපත්තු කර්මාන්තකරුවන්ට ලැබෙන සඵල ආරක්ෂණය වනුයේ,

(1) 10% (2) 16.67% (3) 13.33% (4) 12% (5) 18%


38. ගෙවුම් ශේෂ ලේඛනයේ සමස්ත ශේෂය ලෙස සැලකෙන්නේ,
   (1) ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂයයි.
   (2) විදේශ ගනුදෙනුවල සමස්ත ප්‍රතිඵලයයි.
   (3) ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂයට මූල්‍ය ගිණුම ගැලපීම මගින් ලැබෙන ශේෂයයි.
   (4) නේවාසිකයන් හා අනේවාසිකයන්ගේ මූල්‍ය වත්කම් හා වගකීම අතර වෙනසයි.
   (5) ජාත්‍යන්තර සංචිත වල ශුද්ධ වෙනසයි.

39. චීන රජය විසින් ශ්‍රී ලංකාවට පරිත්‍යාග වශයෙන් ලබා දුන් සහල් තොගයේ වටිනාකම ගෙවුම් ශේෂ ලේඛනයේ සටහන් කරනුයේ,
   (1) ද්විතියික ආදායම් ගිණුම හර, මූල්‍ය ගිණුම බැර වශයෙනි.
   (2) ජංගම ගිණුම බැර, මූල්‍ය ගිණුම හර වශයෙනි.
   (3) ප්‍රාග්ධන ගිණුම බැර, මූල්‍ය ගිණුම හර වශයෙනි.
   (4) ප්‍රාථමික ආදායම් ගිණුම බැර, සේවා ගිණුම හර වශයෙනි.
   (5) ද්විතියික ආදායම් ගිණුම බැර, භාණ්ඩ ගිණුම හර වශයෙනි.

40. රටකට මුදලේ අගය අවප්‍රමාණය කිරීමෙන් හෝ ක්ෂය වීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගත හැකි වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

| | **අපනයන මිල ඉල්ලුම් නම්‍යතාව** | **ආනයනික මිල ඉල්ලුම් නම්‍යතාව** |
|---|---|---|
| (1) | 0.7 | 0.8 |
| (2) | 0.5 | 0.6 |
| (3) | 0.6 | 0.2 |
| (4) | 0.8 | 0.1 |
| (5) | 0.6 | 0.3 |

41. ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද ඩොලර් සඳහා වන විදේශ විනිමය වෙළඳපොළ පහතින් දැක්වේ.




මින් අදහස් වන්නේ,
   (1) විදේශ විනිමය අනුපාතිකය අධිතක්සේරු වී ඇති බව හා ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය ඩොලරයක් රුපියල් 75 කට වැඩි බවයි.
   (2) විදේශ විනිමය අනුපාතික ඌන තක්සේරු වී ඇති බව හා ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය රු.75 ට වැඩි බවයි.
   (3) විදේශ විනිමය අනුපාතිකය අධි තක්සේරු වී ඇති බව හා ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය රු.75 ට අඩු බවයි.
   (4) විදේශ විනිමය අනුපාතිකය ඌන තක්සේරු වී ඇති බව හා ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය රු.75 ට අඩු බවයි.
   (5) විදේශ විනිමය අනුපාතිකය ස්ථාවර බව හා ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය රු.75 ක් බවයි.

42. කිසියම් භාණ්ඩ පැසක් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රුපියල් 800 ක් වැය වන අතර එම භාණ්ඩ පැසම ඇමරිකාව තුළ දී ඩොලර් 20 ට මිලදී ගත හැකි යැයි ද අනෙකුත් කරුණු ස්ථාවරව තිබිය දී ශ්‍රී ලංකාවේ භාණ්ඩ පැස මිලට ගැනීම සඳහා වැය වන මුදල රු.1000 දක්වා ඉහළ ගියේ නම් එකඟ විය හැකි ප්‍රකාශය.

(1) ඇමරිකාවේ වෙළඳ ශේෂය යහපත් වී ශ්‍රී ලංකාවේ වෙළඳ ශේෂය අයහපත් ය.

(2) ශ්‍රී ලංකාවේ අපනයන ධෛර්යමත් වී ඇමරිකාවේ ආනයන අධෛර්යමත් වේ.

(3) ශ්‍රී ලංකාවේ වෙළඳ ශේෂය යහපත් වී ඇමරිකාවේ වෙළඳ ශේෂය අයහපත් වේ.

(4) අනෙකුත් රටවල් අභිබවා ශ්‍රී ලංකාවේ තරඟකාරිත්වය ඉහළ යනු ඇත.

(5) නාමික විනිමය අනුපාතය ස්ථාවරව තිබිය දී ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතය මත රුපියලේ බාහිර අගය අඩුවේ.

43. කල්පිත වර්ෂයක දී රටක ගෙවුම් ශේෂ ලේඛනයට අදාළ දත්ත පෙළක් පහත දැක්වේ. අගයන් ඇ.එ.ජ. ඩොලර් මිලියන වලිනි.

ප්‍රාග්ධන ගිණුම ශුද්ධ ශේෂය 250

ජංගම ගිණුම ශුද්ධ වෙනස්වීම –2800

මූල්‍ය ගිණුම

මූල්‍ය වත්කම් ශුද්ධ අත්කර ගැනීම –590

මූල්‍ය වගකීම් ශුද්ධ වෙනස්වීම් 2740

ඉහත තොරතුරු වලට අනුව ශුද්ධ වැරදි හා අත්හැරීම් වල ඇ.එ.ජ. ඩොලර් මිලියන වටිනාකම වන්නේ,

(1) – 550 කි. (2) 580 කි. (3) – 580 කි. (4) 550 කි. (5) – 780 කි.

44. රටක තාක්ෂණයේ හටගන්නා වෙනස්කම් හෝ කිසියම් භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම සදාකාලිකව ශුන්‍ය වන තත්ත්වයක් තුළ හටගන්නා රැකියා විරහිතභාවය නිර්වචනය කරනුයේ,

(1) සැඟවුණු සේවා වියුක්තිය වශයෙනි.

(2) ව්‍යුහාත්මක සේවා වියුක්තිය වශයෙනි.

(3) සාර්ෂික සේවා වියුක්තිය වශයෙනි.

(4) ඌණ සේවා නියුක්තිය වශයෙනි.

(5) අවිධිමත් සේවා වියුක්තිය වශයෙනි.

45. බහුමාන දරිද්‍රතා දර්ශකය ගණනය කරන ආකාරය දැක්වෙන්නේ කවර ප්‍රකාශයෙන් ද?

(1) ජනගහන දරිද්‍රතා දර්ශකය x විහීනතා දර්ශකය

(2) අන්තර් දරිද්‍රතා දර්ශකය x විහීනතා දර්ශකය

(3) දිළිඳු ජනගහනයේ ප්‍රමාණය x විහීනතා දර්ශකය

(4) මානව දරිද්‍රතා දර්ශකය x විහීනතා දර්ශකය

(5) අන්තර් දරිද්‍රතා දර්ශකය x මානව දරිද්‍රතා දර්ශකය

46. කල්පිත ආර්ථිකයක ජනගහනය සම්බන්ධ දත්ත සමූහයක් පහත දැක්වේ.


| | **පුද්ගලයන් මිලියන** |
|---|---|
| මුළු ජනගහනය | 230 |
| පුරුෂ ජනගහනය | 120 |
| අවුරුදු 15 න් ඉහළ ජනගහනය | 210 |
| ආර්ථික වශයෙන් සක්‍රිය නොවන ජනගහනය | 80 |
| සේවා නියුක්ත ජන සංඛ්‍යාව | 09 |

මෙම ආර්ථිකයේ,

| | ශ්‍රම බලකාය (පුද්ගල මිලියන) | ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | විරැකියා අනුපාතිකය |
|---|---|---|---|
| (1) | 120 | 25% | 7% |
| (2) | 200 | 33.3% | 5% |
| (3) | 180 | 33.3% | 5% |
| (4) | 120 | 25% | 5% |
| (5) | 200 | 30% | 7% |

47. තිරසාර සංවර්ධනයේ සමාජීය පැතිකඩට අදාළ සංරචක වන්නේ,
    (1) සාධාරණත්වය, සහභාගිත්වය, සවිබල ගැන්වීම.
    (2) කාර්යක්ෂමතාවය, සහභාගිත්වය, සවිබල ගැන්වීම.
    (3) කාර්යක්ෂමතාවය, සහභාගිත්වය, ස්ථායිතාවය.
    (4) ස්ථායිතාවය, සහභාගිත්වය, සවිබල ගැන්වීම.
    (5) ස්ථායිතාවය, සහභාගිත්වය, සමාජ සහජීවනය

48. එක්තරා ආර්ථිකයක් සම්බන්ධයෙන් නිර්මාණය කරන ලද ලෙ ලෝරන්ස් වක්‍රය පහත රූප සටහනේ දැක්වේ.




රජය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලය ලෙස ලෝරන්ස් වක්‍රය A සිට B දක්වා විතැන් වූයේ නම්,
    (1) ආදායම් ව්‍යාප්තියේ විෂමතාව අඩු වනු ඇත.
    (2) දිළින්දන්ට තව දුරටත් අහිතකර වනු ඇත.
    (3) දිළිඳු ජනගහන දර්ශකය ඉහළ යනු ඇත.
    (4) සමාජ සාධාරණත්වය අරමුණු කරගත් රාජ්‍ය ප්‍රතිපත්ති වහා වෙනස් කළ යුතුය.
    (5) රාජ්‍ය ප්‍රතිපත්ති ධනවතුන්ට ප්‍රතිලාභ තවදුරටත් ඉහළ නැංවීමට හේතු වී ඇත.

49. පහත දැක්වෙන වෙළඳ ගිවිසුම් අතරින් වර්තමාන වන විට ක්‍රියාත්මක නොවන ද්වි පාර්ශවීය වෙළඳ ගිවිසුමක් වනුයේ,
    (1) ඉන්දු - ශ්‍රී ලංකා ද්වි පාර්ශවීය වෙළඳ ගිවිසුම.
    (2) පකිස්තානු - ශ්‍රී ලංකා ද්වි පාර්ශවීය වෙළඳ ගිවිසුම.
    (3) තායිලන්ත - ශ්‍රී ලංකා ද්වි පාර්ශවීය වෙළඳ ගිවිසුම.
    (4) සිංගප්පූරු - ශ්‍රී ලංකා ද්වි පාර්ශවීය වෙළඳ ගිවිසුම.
    (5) බංග්ලාදේශ - ශ්‍රී ලංකා ද්වි පාර්ශවීය වෙළඳ ගිවිසුම.

50. ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය ජය ගැනීම සඳහා ක්‍රියාවට නැංවීමට අත්‍යාවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කමක් නොවන්නේ,
    (1) ගෙවුම් ශේෂ තිරසාර භාවය උදෙසා වෙළඳ හා ආයෝජන ප්‍රවාහ ධෛර්යමත් කිරීම.
    (2) ණය ප්‍රති ව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම.
    (3) දූෂණය වැළැක්වීම හා නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම.
    (4) ස්ථාවර විනිමය අනුපාතිකයක් තුළ රුපියලේ අගය ස්ථාවරව පවත්වාගෙන යාම.
    (5) පොදු සෞඛ්‍ය හා අධ්‍යාපන පද්ධතිය ශක්තිමත් කිරීමට ප්‍රමාණවත් අරමුදල ලබාදීම.

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| 13 ශ්‍රේණිය | 21 | S | II | ආර්ථික විද්‍යාව II / Economics II | කාලය : පැය තුනයි / Time : Three hours |
|---|---|---|---|---|---|

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.
Additional Reading Time : 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

- **'අ' උප කොටසින්** අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, **'ආ' උප කොටසින්** අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

(1). (i) පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීම යනුවෙන් අදහස් වන්නේ "සලකා බලන කාලය තුළ නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට යෝග්‍ය සියලු සම්පත් නිෂ්පාදනය සඳහා භාවිතයට ගැනීමයි." මෙහි නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට යෝග්‍ය සියලු සම්පත් යනුවෙන් කුමක් අදහස් වේද? (ලකුණු 04 යි)

(ii) භූමිය ස්වාභාවික ප්‍රාග්ධනයෙන් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 04 යි)

(iii) පහත සඳහන් සිදුවීම් මූලයට අවතල නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර මගින් පැහැදිලි කරන්න.

(අ) පුනර්ජනනීය බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය යටතේ නව සුළං විදුලි බලාගාර දෙකක් පද්ධතියට එකතු වීම.

(ආ) ජාත්‍යන්තර වෙළඳ අනුපාතය දියුණු වීම.

(ඉ) බදු ප්‍රතිසංස්කරණයෙන් පසු පෞද්ගලික ආයෝජන පහළ යාම.

(ඊ) විදේශගතව සිටි ශ්‍රමිකයන්ගෙන් විශාල පිරිසක් නැවත තම රටට පැමිණීම.

(ලකුණු 2 x 4 = 8)

(iv) "වෙළඳපොළ ආර්ථික ක්‍රමය ආර්ථික වශයෙන් කාර්යක්ෂම වන නමුදු සමාජ සුභසාධනය ප්‍රශස්ත මට්ටම කරා ළඟා නොවේ යැයි ද තර්ක කෙරේ." මෙම පැතිකඩ දෙක ඔබ තහවුරු කරන්නේ කෙසේද? (ලකුණු 04 යි)

(2). (i) "ඇතැම් භාණ්ඩවල මිල වෙනස්වීම මත ඉල්ලුම් ප්‍රමාණය ඊට සාපේක්ෂව වැඩි අනුපාතයකින් ද සමහර භාණ්ඩවල අඩු අනුපාතයකින් ද වෙනස් වේ." මේ සඳහා බලපාන සාධක කවරේද? (ලකුණු 06 යි)

(ii) බාල භාණ්ඩයක් සඳහා තිබෙන ඉල්ලුම ඉල්ලුම් නීතියට එකඟ විය හැකි යැයි ඔබ සිතන්නේ ද? (ලකුණු 03 යි)

(iii) කිසියම් භාණ්ඩයක නිදහස් වෙළඳපොළ සමතුලිතයක් පැවති අතර භාණ්ඩයේ මිල ඉහළ යාමක් සිදු වූ විට ඒ හා සමඟම ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ද ඉහළ යාමක් නිරීක්ෂණය විය. එම තත්ත්වය රූප සටහනකින් දක්වා එවැනි වෙනසකට බලපෑ හැකි හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(iv) කිසියම් භාණ්ඩයක් සඳහා ඇති අධි ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණය පහතින් දැක්වේ.

අධි ඉල්ලුම් සමීකරණය $EQd = 300 - 6P$

සැපයුම් සමීකරණය $Qs = 100 + 4P$

(අ) සමීකරණ ඇසුරෙන් සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 03 යි)

(ආ) වෙළඳපොළ සමතුලිත වන විට පාරිභෝගික අතිරික්ත සහ පාරිභෝගිකයා ගෙවීමට සූදානම් උපරිම මුදල් ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02 යි)

(ඉ) සමතුලිත මිලේ දී නිෂ්පාදන අතිරික්තය හා නිෂ්පාදකයා අපේක්ෂා කරන අවම ආදායම් ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02 යි)

(3). (i) උපරිම මිල පාලනය හා අවම මිල පාලනය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) "වෙළඳපොළක සඵල සමතුලිතයක් ඇතිවීමට නම් භාණ්ඩයක උපරිම ඉල්ලුම් මිලට වඩා අවම සැපයුම් මිල අඩු විය යුතුය." එකඟ වන්නේ ද පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ප්‍රාථමික අමු ද්‍රව්‍යමය නිෂ්පාදනවල හා කෘෂි නිෂ්පාදනවල නිතර මිල උච්චාවචනය වන්නේ ඇයි? එය වළක්වා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියමාර්ග මොනවාද? (ලකුණු 04 යි)

(iv) තරඟකාරි වෙළඳපොළක අලෙවි වන භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් වක්‍රයන්හි සමීකරණ පහත දැක්වේ.

ඉල්ලුම් සමීකරණය $Qd = 400 - 4P$

සැපයුම් සමීකරණය $Qs = -100 + 6P$

මෙම භාණ්ඩයේ නිෂ්පාදනය සඳහා රු.5 ක ඒකක බද්දක් පැනවීමට රජය ක්‍රියා කළේ නම්,

(අ) බද්දෙන් පසු ඒකකයක් සඳහා ගැණුම්කරුවන් ගෙවන මිල කොපමණ ද?

(ආ) බද්දෙන් පසු පාරිභෝගික අතිරික්තය වෙනස් වූ ප්‍රමාණය කොපමණ ද?

(ඉ) රජයේ බදු අයභාරය කොපමණ ද?

(ඊ) නිෂ්පාදකයාට බද්දෙන් පසු ඒකකයක් සඳහා ලැබෙන මිල කොපමණ ද?

(ලකුණු 2 x 4 = 8)

(4). (i) "විචල්‍ය සාධක අනුපාත නීතිය" පැහැදිලි කරන්න. මෙම නීතිය පදනම් වන උපකල්පන කවරේ ද? (ලකුණු 04 යි)

(ii) ආර්ථික විද්‍යාඥයෝ පිරිවැය ලෙස සලකන සමහර අයිතම ගණකාධිකාරින් පිරිවැයක් ලෙස නොසලකයි. මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ණ තරඟකාරී ආයතනයකට අදාළ පහත අවස්ථා යෝග්‍ය රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

(අ) ආයතනය නිෂ්පාදන ක්‍රියාවලියේ දී අලාභ ලැබුව ද තවදුරටත් නිෂ්පාදනයේ නිරත වන අවස්ථාව (ලකුණු 02 යි)

(ආ) ආයතනයේ කෙටිකාලීන සැපයුම් වක්‍රය ව්‍යුත්පන්න කිරීම. (ලකුණු 02 යි)

(iv) පැවරුණු මිලක් යටතේ කටයුතු කරන නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී ඒකකයක් රු.60 බැගින් අලෙවි කරන බවත් නිමැවුම් ප්‍රමාණය ඒකක 25 ක් බවත් සිතන්න. පවත්නා නිමැවුම් මට්ටමේ දී පිළිවෙලින් සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු.16 වන අතර සාමාන්‍ය පිරිවැය රු.54 ක් වේ.

(අ) ආයතනයේ කෙටිකාලීන ලාභය හෝ අලාභය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) පවත්නා නිමැවුම් මට්ටමේ දී නිෂ්පාදන අතිරික්තය කොපමණ ද? (ලකුණු 02 යි)

(v) බදු කුලිය භූමිය නැමති සාධකයේ ඉපැයීම බැවින් ආර්ථික බදු කුලියක් ඉපැයිය හැක්කේ ස්වාභාවික සම්පත් හිමියන්ට පමණි. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? (ලකුණු 04 යි)

(5). (i) පහත සඳහන් ආයතන හෝ පුද්ගලයන් ශ්‍රී ලංකා ආර්ථිකයේ කුමන ආයතනික අංශයට අයත්වේදැයි දක්වන්න.

(අ) තම පවුලේ පරිභෝජනයට ජලාශයකින් මසුන් අල්ලා ගන්නා පුද්ගලයෙක්

(ආ) ශ්‍රී ලංකාවට මෝටර් රථ අපනයන කරනු ලබන TOYOTA සමාගම

(ඉ) ත්‍රිවිධ හමුදාව

(ඊ) අලෙවිය සඳහා තේ වගා කරන තේ වත්තක්

(ලකුණු 1 x 4 = 4)

(ii) එක්තරා ආර්ථිකයක ජාතික ගිණුම් දත්ත ඇසුරින් ලබාගත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ. වටිනාකම රුපියල් බිලියන වලිනි. (ලකුණු 04 යි)

| අයිතමය | වටිනාකම (රු.මි.) |
|---|---|
| සේවක ගෙවීම | 5000 |
| දළ මෙහෙයුම් අතිරික්තය (මිශ්‍ර ආදායම ද ඇතුළත්) | 3000 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම | 100 |
| භාණ්ඩ මත ශුද්ධ බදු | 1000 |
| නිෂ්පාදනය මත වෙනත් ශුද්ධ බදු | 1500 |
| අවශේෂ ලෝකයෙන් ශුද්ධ ප්‍රාථමික ආදායම් ලැබීම් | (-1000) |
| අවශේෂ ලෝකයෙන් ලැබෙන ශුද්ධ වර්තන සංක්‍රාම | 1200 |
| සමාගමික ආදායම් බදු | 500 |
| නොබෙදූ ලාභ | 600 |
| කුටුම්භවලට රජය ලබා දුන් සංක්‍රාම | 2000 |

ඉහත තොරතුරු භාවිතයෙන් පහත ජාතික ගිණුම් දර්ශක ගණනය කරන්න.

(අ) දළ දේශීය නිෂ්පාදිතය

(ආ) ශුද්ධ ජාතික ආදායම

(ඉ) වැය කළ හැකි දළ ජාතික ආදායම

(ඊ) පෞද්ගලික ආදායම (කුටුම්භ ආදායම)

(ලකුණු 2 x 4 = 8)

(iii) දළ දේශීය නිෂ්පාදිතය (y) රුපියල් මිලියන 6000 ක් බවත්, පෞද්ගලික වැය කළ හැකි ආදායම රු.මි.5100 ක් බවත්, ආණ්ඩුවේ අය වැය හිඟය රු.මි.200 ක් බවත්, පරිභෝජන වියදම රු.මි.3800 ක් බවත්, වෙළඳ ශේෂයේ හිඟය රු.මි.100 ක් බවත් සලකන්න.

(අ) ඉතුරුම් (S) කොපමණ ද?

(ආ) ආණ්ඩුවේ මිලදී ගැනීම් (G) කොපමණ ද?

(ඉ) ආයෝජන මට්ටම (I) කොපමණ ද?

(ලකුණු 1 x 3 = 3)

(iv) කල්පිත සංවෘත ආර්ථිකයක තොරතුරු පහත දැක්වේ.

$C = 180 + 0.8yd$

$I = 400$

$G = 300$

$T = 100$

(අ) සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 01 යි)

(ආ) සමතුලිත අවස්ථාවේ අයවැය ශේෂය ගණනය කරන්න. (ලකුණු 01 යි)

(ඉ) ස්වාධීන වියදම් ගුණකය ගණනය කරන්න. (ලකුණු 01 යි)

(ඊ) සමතුලිත නිමැවුම ඒකක 800 කින් ඉහළ දැමීමට ආයෝජනය කොතරම් ප්‍රමාණයකින් ඉහළ දැමිය යුතුද? (ලකුණු 02 යි)

**<u>'ආ' උප කොටස</u>**

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

(6). (i) නිෂ්පාදන මිල දර්ශකය හඳුන්වා එහි වැදගත්කම දක්වන්න. (ලකුණු 04 යි)

(ii) හොඳ මුදලක දක්නට ලැබෙන ලක්ෂණ එහි කාර්යයන් ඉටු කර ගැනීම සඳහා යොදා ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත සඳහන් ප්‍රකාශ සමඟ ඔබ එකඟ වන්නේදැයි පැහැදිලි කරන්න.

(අ) මහජනතාව තමන් සතු මුදල් වාණිජ බැංකුවල තැන්පත් කරන විට ව්‍යවහාර මුදල් අඩුවීම නිසා මුදල් සැපයුම අඩුවේ.

(ආ) අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී නම් රටක මුදල් සැපයුම සහ පොලී අනුපාතිකය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී.

(ලකුණු 2 x 2 = 4)

(iv) ශ්‍රී ලංකා මහ බැංකුව විවෘත වෙළඳපොළෙන් සුරැකුම්පත් මිලදී ගැණුම් අනුපාතිකය සමාහාර ඉල්ලුම කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) පහත දැක්වෙන්නේ කිසියම් වර්ෂයක මූල්‍ය සමස්තය පිළිබඳ තොරතුරුය.

| | |
|---|---|
| මහජනයා විසින් වාණිජ බැංකුවල පවත්වාගෙන යන තැන්පතු | රු.බිලි.50 |
| පටු මුදල් සැපයුම ($M_1$) | රු.බි.200 |
| පුළුල් මුදල් සැපයුම ($M_2$) | රු.බි.560 |
| සංචිත මුදල් | රු.බි.125 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) මහජනයා සතු ව්‍යවහාර මුදල්වල වටිනාකම කොපමණ ද? (ලකුණු 01 යි)

(ආ) මහජනතාව වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලැබූ කාලීන හා ඉතුරුම් තැන්පතුවල වටිනාකම ගණනය කරන්න. (ලකුණු 01 යි)

(ඉ) $M_2$ මුදල් ගුණකය ගණනය කර එහි වටිනාකම පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 02 යි)

(7). (i) බෝවන රෝග සඳහා ප්‍රතිකාර ලබා ගැනීම වෙළඳපොළ මඟින් සීමා කිරීම සමාජ යහපතට හේතු නොවේ. මෙම තත්ත්වය සුදුසු රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) ආන්තික බදු අනුපාතය යනු කුමක් ද? එහි ස්වරූප තුන පැහැදිලි කරන්න. ශ්‍රී ලංකාවේ බදු නොවන මූලාශ්‍ර කවරේද? (ලකුණු 04 යි)

(iii) වර්තමාන ආර්ථිකයක් තුළ වෙළඳපොළ අසමත්වීම පමණක් නොව රාජ්‍ය අසමත් වීම් ද දක්නට ලැබේ යන ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? (ලකුණු 04 යි)

(iv) ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම් ව්‍යුහය දැඩි අනම්‍ය ස්වභාවයක් දක්නට ලැබෙන බව ආර්ථික විද්‍යාඥයෝ පෙන්වා දෙති. මෙම ප්‍රකාශය සනාථ කරමින් එහි අහිතකර බලපෑම් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) පහත සංකල්ප අතර වෙනස දක්වන්න.

(අ) විසර්ජන පනත

(ආ) අතුරු සම්මත ගිණුම

(ලකුණු 2 x 2 = 4)

(8). (i) හොංකොං සහ සිංගප්පූරුව යන රටවල් දෙකටම යෙදවුම් ඒකක 200 බැගින් ඇත. ඒවා සමානව පරිගණක හා ජංගම දුරකතන සඳහා වෙන් කර ඇත. දෙරටටම පරිගණකයක් හා ජංගම දුරකතනයක් නිපදවීමට අවශ්‍ය ශ්‍රම පැය ප්‍රමාණය පහතින් දැක්වේ.

| ශ්‍රම පැය | හොංකොං | සිංගප්පූරුව |
|---|---|---|
| පරිගණකයක් නිපදවීම සඳහා | 4 | 4 |
| ජංගම දුරකතනයකින් නිපදවීම සඳහා | 2 | 1 |

මෙම තොරතුරු අදාළ කර ගනිමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) එක් එක් රටේ නිෂ්පාදන හැකියා වක්‍රය ප්‍රස්ථාර සටහනක් මඟින් දක්වන්න.

(ආ) එක් එක් රටට සාපේක්ෂ වාසිය ඇත්තේ කිනම් භාණ්ඩ සම්බන්ධයෙන් ද?

(ඉ) එක් එක් රටෙහි අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක හුවමාරු අනුපාතිකය ගණනය කරන්න.

(ලකුණු 2 x 3 = 6)

(ii) පහත ගණුදෙනු ගෙවුම් ශේෂ ලේඛනයේ ද්විත්ව සටහන් තබන ආකාරය දක්වන්න.

(අ) ළමා මන්දපෝෂණය පාලනය කිරීම සඳහා චීන රජය විසින් රු.මි.10 ක් පරිත්‍යාග කිරීම.

(ආ) ලංකා පෙප්සිකෝලා සමාගම ඇමරිකාවේ පෙප්සිකෝලා සමාගමට වරලත් බලපත්‍ර ගාස්තු ගෙවීම.

(ඉ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් විස්තීර්ණ ණය පහසුකම යටතේ ඩොලර් මිලියන 1500 ක් ශ්‍රී ලංකා රජය වෙත ලබා දීම.

(ඊ) ශ්‍රී ලංකාවේ ජෝන් කීල්ස් සමූහය විසින් තම විදේශ ආයෝජකයන්ට ලාභාංශ ගෙවීම.

(ලකුණු 1 x 4 = 4)

(iii) රටක පොදු මිල මට්ටමේ ඉහළ යාමක් එරට ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම කෙරෙහි කෙසේ බලපානු ලැබේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමේ අරමුණු මොනවාද? (ලකුණු 03 යි)

(v) ශ්‍රී ලංකාවේ අපනයන අංශය මුහුණ දී සිටින දේශීය හා විදේශීය අභියෝග කවරේද? (ලකුණු 03 යි)

(9). (i) මානව සංවර්ධන දර්ශකයේ අන්තර්ගත වන ප්‍රධාන පැතිකඩ තුන සඳහන් කොට වර්තමාන ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකයේ උපනති දක්වන්න. (ලකුණු 04 යි)

(ii) "ඌන සේවා නියුක්තිය" හා "සැඟවුණු සේවා නියුක්තිය" අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(iii) ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය යන්නෙන් කුමක් අදහස්වේද? එහි සංක්‍රාන්ති අදියර නම් කරන්න.
(ලකුණු 04 යි)

(iv) “2050 දී ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහන ප්‍රතිශතය 28.8% දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකතනය කර ඇත.

(අ) ජනගහනය වයස්ගත වීම යනු කුමක් ද? ඒ සඳහා බලපෑ ප්‍රධාන සාධක කවරේද? (ලකුණු 04 යි)

(ආ) ජනගහනය වයස්ගත වීමත් සමඟ පැන නගින ආර්ථික හා ආර්ථික නොවන ගැටළු කවරේද?
(ලකුණු 04 යි)

(10).(i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකමෙහි අරමුණු මොනවාද? (ලකුණු 04 යි)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය හමුවේ මහ බැංකුව දියත් කළ ණය ප්‍රසස්ථීකරණය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) 2022 වර්ෂය තුළ සේවා අංශය ප්‍රබලතම අංශය බවට එක් වී ඇත. ඒ සඳහා ඉහළ දායකත්වයක් ගෙන ඇති අංශ කවරේද? එහි දායකත්වයක් සමඟ ලියා දක්වන්න. (ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ දුප්පත්කම පිටු දැකීම සඳහා ක්‍රියාත්මක කළ සමෘද්ධි ප්‍රතිලාභ ක්‍රමයට සාපේක්ෂව “අස්වැසුම” සමාජ සුබසාධන ප්‍රතිලාභ ක්‍රමයේ පවතින වාසි හා අවාසි තත්ත්වයන් පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

PAST PAPERS WIKI

(16) WWW.PastPapers.WiKi (16)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

[illegible]

# බහුවරණ උත්තර පත්‍රය/பல்தேர்வு விடைத்தாள்/MCQ Answer Sheet

විෂය සහ විෂය අංකය
பாடமும் பாட இலக்கமும்
Subject and Subject No.

මාධ්‍යය
மொழிமூலம்
Medium

විභාග අංකය
சுட்டெண்
Index No.

[illegible]
Invigilator's signature and date for centre Index Number and other details

| Q | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| 1 | | X | | | |
| 2 | | | X | | |
| 3 | | | | X | |
| 4 | | X | | | |
| 5 | X | | | | |
| 6 | | | X | | |
| 7 | | | X | | |
| 8 | X | | | | |
| 9 | | | | X | |
| 10 | | X | | | |
| 11 | | | | | X |
| 12 | | X | | | |
| 13 | | | | X | |
| 14 | | | X | | |
| 15 | | | X | | |
| 16 | | | | X | |
| 17 | | | | X | |
| 18 | X | | | | |
| 19 | | X | | | |
| 20 | | | | | X |
| 21 | | X | | | |
| 22 | | X | | | |
| 23 | | | | X | |
| 24 | | X | | | |
| 25 | | | X | | |
| 26 | | | X | | |
| 27 | | X | | | |
| 28 | | | X | | |
| 29 | | | | | X |
| 30 | | X | | | |
| 31 | X | | | | X |
| 32 | | X | | | |
| 33 | | | X | | |
| 34 | | | | | X |
| 35 | | X | | | |
| 36 | | | | X | |
| 37 | X | | | | |
| 38 | | | | | X |
| 39 | | | | | X |
| 40 | X | | | | |
| 41 | X | | | | |
| 42 | X | | | | |
| 43 | | | | | X |
| 44 | | X | | | |
| 45 | X | | | | |
| 46 | X | X | X | X | X |
| 47 | X | | | | |
| 48 | X | | | | |
| 49 | | | | | X |
| 50 | | | | X | |

46 – All